


# දිය රැළි තුළින් මතුවන සතුනගේ නිදහස් වන දිවිය

**දවස නිමාවෙත්ම සමහර වන සතුන් තමා ගත කළ දිනයෙන් සමුගන්නා අතර තවත් සමහර සතුන් රාත්‍රිය සඳහා සූදනම් වෙනවා. ඊග්‍රට් නමැති කුරුල්ලන් තම කැදලිවලට වී පැටවුන් පෝෂණය කිරීමක යෙදෙනවා. සියළුම වන සතුනට තම පැවැත්ම ගැන හැඟුමක් තිබෙන අතර කැට්වල් නමැති මත්සයා දිය කඩිතිවල පතුලෙහි ඇති මඩ වගුරුවලට කිඳ බසිනවා.**



කේ. තිස්ස ඇස්. පීරිස්

හිරු බැසයත්ම ඩෙල්ටා කලපුවල ඇති ඕලු වැනි මල් පිබිදීමට පටත් ගන්නවා. කිඹුලන් විසින් දිවා කාලයෙහි දඩයම් කරගන්නා ලද හිපපොටෙමස් සත්ත්වයාගේ මාංශ රාත්‍රී කාලයෙහි අනුභව කිරීමට පටත් ගන්නවා. දිවා කාලයෙත් සමුගන්නා ඉම්පාලාවන් රාත්‍රී කාලයෙහි සිංහයන් විසින් දඩයම් කර තම ගොදුරු බවට පත් කර ගන්නවා. නැවත හිරු උදාවෙත්ම සිංහයන්ගෙන් ගැලවුන ඉම්පාලාවන් හතික ආරක්ෂක ස්ථාන බලා පැනයනවා. සිංහයන්, අලින්ගේ මලකුනුවල ඉව ඔස්සේ සැතපුම් පහක් පමණ ඇවිදගෙන ගොස් ඒවා ආහාරයට ගන්නවා.

ඇන්ගෝලාවට නුදුරින් පිහිටි උස්බිම් හරහා ඇද හැලෙන වැසි ජලය නැම්බියාවෙහි සිට බොට්ස්වානා දෙසට ගලාවුත් ඔකාවැන්ගෝ නදියෙහි ජල මට්ටම වැඩිකරනවා. මෙම ගඟබඩ වූ විශාල තෙත් බිමෙත් වනසතුන් සහ ගහකොළ යනාදිය පෝෂණය ලබමින් ගෙවන අසිරිය ඉතාමත්ම ආනන්දජනකයි. මෙම නදිය බොට්ස්වානයට ඇතුළුවන තැන ඉතා මඩ සහිත ය. මෙම නදිය හරහා හමා යන සුළඟ ජලයෙහි වැදී එක්තරා කැලඹීමක් ඇති කරයි. මෙහි සිදුවන පරිසර දූෂණය මග හැරීමට මෙන් හිපපොටේමස් සතුන් එහි ඇති මඩ ගොහොරු ගිල දමමින් මෙම ජලාශය පිරිසිදු කරන අතර මඩ ගොඩට ඇද දමමින් ගොවියනට තම වගා කටයුතුවලට අවශ්‍ය පොහොර සපයා හිතවතෙකු බවට ද පත්වී ඇත. මෙම නදිය මඳක් ඈතින් කල්හාරි වැලිතලය මත තැනින් තැන කුඩා ක්ෂේම භූමි උස්වූ ගොඩබිම් ලෙසින් දැකිය හැක. මෙහි සිට වැඩි දුරක් යාමට පෙර අප්‍රිකාවේ යෝධ කුහුඹුවන්, සීබ්‍රාවන් සහ කලු ඊග්‍රට් කුරුල්ලන් වසන පෙදෙස් දක ගත හැක. මෙම නදී ඉවුරෙහි මසුන් දඩයම් කරමින් වෙසෙන අප්‍රිකානු රාජාලි වර්ගයක් ද දැකිය හැක. දිය පහර අසබඩ වෙසෙන මසුන් ඔවුනගේ ප්‍රියතම ආහාරය වී ඇත.

දිය යට කිමිදී මසුන් දඩයම් කරන ඇන්හින්ගා නමැති පක්ෂියෙක් ද මෙහි වෙසේ.

එම පක්ෂියා මත්ස්‍යයෙකු අල්ලාගත් විට උගේ හිසෙහි සිට මුලු ගතම හොටෙන් තෙරපා හරිමින් මෙල්ලකර ගනියි.

අඩක් දියෙහි පිහිතා ඉතිරිය දියයට කිමිදෙමින් මේ පක්ෂියා මසුන් දඩයම් කරනුයේ අප රටෙහි වෙසෙන දියකාවෙකු සතුන් දඩයම් කරන්නාක් මෙනි. වසරාවසානයේදී වැසි පවත්නා මෙම උතුරු දිග මිටියාවතෙහි දිය කපොල්ලක සීබ්‍රාවෝ රංචු වශයෙන් වෙසෙති. බොට්ස්වානාහි උතුරු දිග තීරයෙහි වෙරබ් ගඟ අසබඩ දූවිලි සහිත තැනැතිලාවල ගැවසෙන අලි රංචු ද දකගත හැක. මෙහි මී හරක් සමූහ වශයෙන් වෙසෙන කුඩුවක් ද ඇත. උතුරුදිග බොට්ස්වානාවල වෙසෙන මීහරකුන්ගේ ප්‍රමාණය 45,000 යයි ජීව විද්‍යාඥයින් විසින් ගණනය කර ඇත. සමූහ වශයෙන් මේ සියලුම සතුන් ආහාර සහ ජලය සොයා ඒවා සිදුවනුයේ රංචු වශයෙනි. ඒ සඳහා නියම මාර්ගෝපදේශකත්වයකට ඔවුන් හුරුපුරුදුවී ඇති බව පෙනී යයි. ඉම්පාලාවෝ සමූහ වශයෙන් දිය බීමට දියපාරවල් අසලට පැමිණෙති. ඔවුන් මෙම ස්ථානයනට එනුයේ සිංහයින් දිය පානය කර බොහෝ ඈතට යනතෙක් බලා සිටීමෙන් පසුය. ඉම්පාලාවන්ගේ කුසයේ ජලය ගබඩා කිරීමට හැකියාවක් ඇති හෙයින් නිතර ජලය පානය කිරීමේ අවශතාවක් නොමැත.

දවස අවසානයත් සමගම මෙම නදිය අසබඩ වසන සතුනගේ වැඩ මුරයන්හි වෙනස්වීම් ද ඇති වෙයි. සමහර සතුන් බෙනවල ලැගුම් ගන්නා අතර තවත් සමහර සතුන් තම රෑ මුරය පටන් ගනියි. මෙම ගංගාවන් අසල වෙසෙන සතුනගේ නිදහස් වන දිවිය ඒ තරමටම අසිරිමත්ය. චමත්කාර ජනකය. ❑